2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ආදායම් බදු වියදම් සහ පොළී ආදායම් වලට අදාළ ගනුදෙනු වූ මව් සමාගම සමඟ පවත්වාගෙන යන ජංගම ගිණුමේ වාර්තා කරන ලද පිළිවෙලින් රු.117,600 ක සහ රු.296,877 ක වටිනාකම සමග මුදල් ප්‍රවාහයන් සම්බන්ධ වී නොතිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් මුදල් ප්‍රවාහ සහ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ හඳුනාගෙන තිබුණි.

(ආ) තනි තනි ගිණුම් පවත්වාගෙන යාම වෙනුවට, සමාගම එකතුව පිළිවෙලින් රු.3,796,876ක් සහ රු.117,600 ක් වූ ගනුදෙනු මව් සමාගම සමඟ පවත්වා ගෙන යන ජංගම ගිණුමේ හර සහ බැර ලෙස වාර්තාගත කර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම විස්තර කෙරෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම විස්තර කෙරෙන ඡේදයන්ට බලපෑ හැකි කරුණු හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.1.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

---------------------------------

දේපල සංවර්ධන ව්‍යාපාරයේ යෙදීම වෙනුවෙන් සමාගම මූලිකව 1985 දී ආරම්භ කර තිබුණු අතර මිලදී ගැනීම්, අලෙවි/කල්බදු හෝ කුලී පිට පදනමට මෝටර් රථ, ලොරි, බස්, වෑන්, ටැක්සි කැබ්ස්, ඔම්නි බස් හෝ ඕනෑම අනෙකුත් ආකාරයේ රථ වාහන ගැනීමට ආදී වශයෙන් එහි අරමුණු පසුකාලීනව විවිධාංගීකරණය කර 2007 වර්ෂයේදි වෙනස්කර තිබුණි. කෙසේවුවද, පසුගිය වසර 32 ක් පුරා බලාපොරොත්තු වූ කාර්යයන්ගෙන් කිසිදු මුදල් ප්‍රවාහයක් උත්පාදනය කර නොතිබුණි. මේ අතරතුර 2013 වර්ෂයේ දී සමාගමට අයත්ව තිබූ එකම දේපල වූ ඉඩම මව් සමාගම විසින් අත්පත් කරගෙන තිබුණි. මෙම කරුණු ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරු කිරීමේදී සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.281,877 ක බදුවලට පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ අලාභය රු.316,649 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.598,526 ක වර්ධනයක් දැක්වුණි. සමාගමේ වියදම් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව විය.

**3.2 අගය එකතුවීම**

-----------------

සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය විශ්ලේෂණයේ දී 2014 වර්ෂය සඳහා සමාගමේ අගය එකතු කිරීම රු.1,111,549 ක් වූ අතර ඊට පසුව අගය එකතු කිරීම සමාලෝචිත වර්ෂය දක්වා කැපී පෙනෙන ලෙස අඛණ්ඩව අඩු වී තිබුණි. එම නිසා වැටුප්, රජයේ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු 2015 වර්ෂය සඳහා අගය එකතු කිරීම රු.671,014 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා එය රු.281,876 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

මව් සමාගමට ලබාදෙන ලද රු.3,500,000 ක් වූ ණය මුදල සඳහා ලැබුණු රු.296,877 ක පොලී ආදායම සමාලෝචිත වර්ෂය සඳහා සමාගම ඉපැයූ එකම ආදායම විය. මෙම ආදායමෙන් රු.83,125 ක් හෙවත් සියයට 28 ක් ආදායම් බදු වශයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේවුවද, 2018 සැප්තැම්බර් 28 දින මව් සමාගම විසින් ජංගම ගිණුම හරහා මෙම ණය මුදල පියවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

-------------------------------------------

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 ප්‍රකාරව සමාගම ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සහ අයවැයක් පිළියෙල කර නොතිබුණි.